**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 27 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබූ රු. 385,725 ක් වටිනා පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් මිලට ගැනීම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වටිනාකම රු. 252,444 ක් වූ භාණ්ඩ 17 ක් අපහරණය කිරීමට පෙර පොත් වලින් ඉවත් කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | අපහරණයෙන් පසු පොත් වලින් ඉවත් කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | උපචිත වියදම් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සැලසිය යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | වර්ෂය තුල මිලදී ගෙන තිබූ රු. 395,070 ක් වූ පාරිභෝජ්‍ය භාණ්ඩ ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල රු. 185,500 කට මිලදී ගෙන තිබුණු පරිගණක යන්ත්‍ර 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් මිලට ගැනීම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සහ උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු. 43,488,253 ක වෙනසක් විය. | ශේෂ සසඳා නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (උ) | සේවක ඇප තැන්පත් ගිණුම හා සේවක ඇප තැන්පත් ආයෝජන ගිණුම අතර රු. 160,529 ක වෙනසක් පැවතුණි. | අදාල ගිණුම් ශේෂ අතර වෙනස හඳුනාගෙන නිරවුල් කරගත යුතුවේ. | ඉදිරියේදී සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම**

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ------------------------- | ------------------ | ------------ | ----------------------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 1988 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලය තුල අවස්ථා 31 කදී ලබාදී තිබුණු රු. 1,898,579 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නොපියවූ අත්තිකාරම් ශේෂයෙන් කොටසක් පියවා ඇති අතර, ඉදිරියේදී ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාල රු. 203,857 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි වලට අනුව රු. 965,937 ක් 2018 වර්ෂයේ අවසාන ගිණුමට ගැලපුම් කර තැන්පතු ලේඛනයෙන් ඉවත් කොට ඇත. |
| (ආ) | 2005 ජූනි 01 දිනැති අංක 2005/04 දරන "ඇතැම් ඉඩම් විකිණීම මත බදු අයකිරීම" නමැති සබරගමුව පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 02(iv) ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගිවිසුමකට එළඹීමකින් තොරව ඉඩම් වෙන්දේසි 03 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,124,128 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 21,488,345 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,237,764 | 6,838,944 | 5,204,861 | 5,904,263 | 5,245,764 | 6,585,755 | 8,256,303 | 4,292,981 |
| (ii) | කුලී | 12,062,300 | 11,648,839 | 11,648,839 | - | 9,564,107 | 9,642,798 | 10,252,848 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,477,000 | 1,616,154 | 1,877,354 | 199,400 | 1,191,000 | 2,255,312 | 1,802,712 | 460,600 |
| (iv) | වෙනත් ආදායම් | 16,833,300 | 17,986,342 | 27,500,683 | 7,321,600 | 12,575,570 | 20,153,129 | 16,991,974 | 17,148,428 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට රු. 909,210 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වර්ෂ 05 ට වඩා වැඩි කාලයක් හිඟ හිට ඇති ඒකක 553 කට අදාල එකතුව රු. 635,223 ක ශේෂයක් පැවතුණි. | හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා විධිමත් හා කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. | මෙම ශේෂයෙන් 2019 මාර්තු 31 දින වනවිට රු. 101,173 ක් අයකර ගෙන ඇත. හිඟ මුදල් අයකර ගැනීමේදී පදිංචිකරුවන් නැති හිස් ඉඩම් විශාල ප්‍රමාණයක් පැවතීම, හිමිකාරිත්වය වරින්වර වෙනස්වීම, නිශ්චිත හිමිකරුවන් හඳුනාගත නොහැකි වීම වැනි ගැටළු මතුවී ඇත. |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශය තුල වූ ආයතන 400 ක් සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු ගෙවා තිබුණද, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශ ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට නිකුත් කර තිබූ බලපත්‍ර සංඛ්‍යාව 150 ක් පමණක් විය. | වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශ ලබා ගැනීමට බලපත්‍ර අයදුම්පත් 400 ක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට යොමුකර ඇතත් නිර්දේශ ලබා දී ඇත්තේ බලපත්‍ර 150 ක් සඳහා පමණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත හඳුනාගැනීමට සභාව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. අදාල බලපත්‍ර ලබා ගතයුතු ආයතන 326 ක් එම බලපත්‍ර ලබාගෙන නොතිබීම හේතුවෙන් සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් සභාවේ වගකීම ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන වෙත විධිමත් පරිදි බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාව විසින් පරිසර බලපත්‍ර නිකුත් කළයුතු ආයතන හඳුනාගෙන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමි. |

## 2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබූ ස්ථිර දැන්වීම් පුවරු සඳහා සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාලව රු. 625,800 ක් අයවිය යුතුව පැවතුණි. | සභාවට අයවිය යුතු සියළු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. |

## 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයවිය යුතු උසාවි දඩ රු. 2,240,269 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයට අදාල හිඟ මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත ලැබිය යුතු සියළු ආදායම් අප්‍රමාදව රැස් කරගත යුතුවේ. | මෙම කාලපරිච්ඡේදයට අදාළව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් තොරතුරු ලබානොදුන් බැවින් නිශ්චිත හිඟ මුදලක් දැක්විය නොහැකි විය. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් රැස් කරනු ලබන කසළ වෙන්කිරීමකින් තොරව අවිධිමත්ව වැවක් ආසන්නයේ පිහිටි රජයේ හිස් ඉඩමකට මුදා හරිමින් පැවතුණි. මේ නිසා වැවෙහි ජලය අපවිත්‍ර වන බවත්, නොදිරන අපද්‍රව්‍ය හේතුවෙන් ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ අවදානමක් පවතින බවත් ඇඹිලිපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා වාර්තා කර තිබුණි. එහෙත් කසළ කළමනාකරණය සඳහා සුදුසු භූමියක් නොමැති වීම හේතුවෙන් අදාළ ගැටළුව විසඳා ගැනීමට නොහැකි වී තිබුණි. | සුදුසු භූමියක් ලබා ගෙන විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | කසළ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් අක්කර 5 ඉඩමක් ලබා ගැනීමට අදාළව අනෙකුත් ආයතන වලින් නිර්දේශ ලබා ගත්තද මධ්‍යම පරිසර අධිකාරියෙන් අදාළ නිර්දේශ ලබා නොදෙන බැවින් එම ඉඩම නිශ්චිතව සභාව වෙත පවරා ගැනීමට නොහැකිව ඇත. එබැවින් වෙනත් ඉඩමක් ලබා ගැනීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ඉල්ලීමක් කර ඇත.<br>එමෙන්ම දැනට කසළ බැහැර කරන ඉඩමේ අපද්‍රව්‍ය චන්ද්‍රිකා වැවට යාම වැළැක්වීමට පස්කඳු බැම්මක් සකසා ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | අදාල දිගුකාලීන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා සම්බන්ධ වී කටයුතු සිදු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 වර්ෂයේ සිදුකර තිබූ නව තක්සේරුව මත වරිපනම් බදු අය කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | නව දේපල තක්සේරුව අනුව බදු අයකළ යුතුවේ. | නව වරිපනම් තක්සේරුවක් සිදුකර බදු ප්‍රතිශතය සඳහා අනුමැතිය ලබා ගැනීමට 2018 දෙසැම්බර් 26 පළාත් සභාව වෙත යොමුකර ඇත. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) තනතුරු 09 කට අදාලව දීර්ඝ කාලයක සිට පවතින පුරප්පාඩු 17 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද සම්පූර්ණ කර නොතිබුණි. | තනතුරු පුරප්පාඩු සඳහා විධිමත් පරිදි නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම තනතුරු පුරප්පාඩු පිරවීමට පළාත් සභාවෙන් ඉල්ලීම් කර ඇත. පළාත් සභාවේ එකඟතාවය මත මුරකරු, පුස්තකාල කම්කරු, බර වාහන ක්‍රියාකරු යන තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදු කර ඇත. |
| (ආ) 2011 වර්ෂයේ සිට හිඟව පවතින විශ්‍රාමික නිලධාරීන් 12 ගේ එකතුව රු. 64,173 ක ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට දැනුම් දී මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ ඉඩම් වෙන්දේසි 03 කින් අයවිය යුතු බදු රු. 220,373 ක් අඩුවෙන් අයකර ගෙන තිබූ අතර, පනතේ 154(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | සභාවට අයවිය යුතු ගාස්තු අයකර ගැනීමට නීතිමය පියවර ගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ වීථි පහන් ස්ථානගත කිරීම් හා නඩත්තු කිරීම් පිළිබඳ විස්තර ඇතුලත් වීථි පහන් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | වීථි පහන් ලේඛනයක් පිළියෙල කර විධිමත්ව නඩත්තු කළ යුතුවේ. | වීථි පහන් ලේඛනය සකසමින් පවතී. |

## 3.6 ප්‍රසම්පාදනය

---------------

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 3,530,100 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි සැලසුමක් අනුව කටයුතු කරමි. |

### 3.6.2 සැපයීම් හා සේවා

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 පෙබරවාරි 28 දිනැති අංක 03/2018 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ අංක 02 හා 04 ඡේද වලට පටහැනිව පළාත් සභාවේ හා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් අවස්ථා 05 කදී එකතුව රු. 672,408 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් අදාළ භාණ්ඩ මිලදී ගැනීමට නොතිබුණ බැවින් හදිසි අවශ්‍යතාවය මත මෙම ආයතන වලින් මිල ගණන් කැඳවා වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුව මිලදී ගෙන ඇත. |

### 3.6.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශයේ මාර්ග 07 ක ඉටු නොකල වැඩ වෙනුවෙන් රු. 330,644 ක් හා එක් මාර්ග සංවර්ධනයක් සඳහා රු. 45,356 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් කාර්යයන් නිසි අධීක්ෂණයට ලක්කළ යුතු අතර, වැඩිපුර ගෙවා ඇති මුදල් අයකරගත යුතුවේ. | රැඳවුම් මුදලින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු. 1,918,982 ක් වැයකර තුංකම පාසල පිවිසුම් මාර්ගය 264.4 m ක් කොන්ක්‍රීට් කර තිබූ අතර, එයින් 195 m ක පමණ ප්‍රමාණයක මතුපිට සිමෙන්ති සහ කළුගල් තට්ටුව ගැලවී ගොස් තිබුණි. ඒ අනුව, එම කොටස සංවර්ධනය සඳහා වැය කරන ලද රු. 1,415,310 ක් නිෂ්ඵල වී තිබුණි. | නිසි අධීක්ෂණයක් යටතේ මාර්ගය නියමිත ප්‍රමිතියෙන් යුක්තව නැවත සකස් කිරීමට හෝ අලාභය අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතුවේ. | තුංකම පාසල් පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වෙතින් විමසන ලද අතර මාර්ගයේ ගල් ගැලවී ඇති මතුපිට ස්ථාන තාර යොදා නැවත සකස් කිරීමට අදාළ කොන්ත්‍රාත්කරු වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 11 කට අදාලව එකතුව රු. 100,266,600 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත්, එකී ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ අයවැය සැකසීමේදී මේ පිළිබඳ අවධානය යොමු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 19 කට අදාලව එකතුව රු. 4,664,080 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 51 සිට සියයට 94 දක්වා පරාසයක ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත්, එකී ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ අයවැය සැකසීමේදී මේ පිළිබඳ අවධානය යොමු කරමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුවේ. | ඉදිරියේදී මේ සඳහා කමිටු පිහිටුවීමට අවධානය යොමු කරමි. |